# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1187/15 – 2001 ජූනි 06 වැනි බදාදා – 2001.06.06

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. -බී.21/78V.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත 22 වන වගන්තිය යටතේ නියමය**

උසස් අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ සංවර්ධන අමාත්‍ය ඉන්දික ගුණවර්ධන වන මම, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 22 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමයෙන් :

(i) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය 2001 ජූනි 15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පිහිටුවමි.

(ii) "ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය" යන නාමය හා අභිධානය එම මණ්ඩපයට පවරමි.

(iii) ඒ මණ්ඩපය පිහිටා තිබිය යුතු ප්‍රදේශය වශයෙන් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය නියම කරමි.

(iv) ජනසන්නිවේදනය සහ ව්‍යාපාර අධ්‍යයනය සහ ව්‍යවහාරික විද්‍යා පීඨ ඒ මණ්ඩපයට පවරමි.

(v) මෙහි උපලේඛනයේ 1 වන තීරයේ දක්වා ඇති ඒ මණ්ඩපයේ එක් එක් පීඨය ඒ උපලේඛනයේ 2 වන තීරයේ අනුරූප සටහනේ දක්වා ඇති අධ්‍යයන අංශවලින් සමන්විත විය යුතු බව නියම කොට දක්වමි.

ඉන්දික ගුණවර්ධන,
උසස් අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ සංවර්ධන අමාත්‍ය.

2001 ජූනි මස 06 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| *1 වන තීරය* | *2 වන තීරය* |
| --- | --- |
| ජනසන්නිවේදනය හා ව්‍යාපාර අධ්‍යයන පීඨය | භාෂා හා ජනසන්නිවේදන අධ්‍යයන අංශය<br>ව්‍යාපාර හා කළමනාකරණ අධ්‍යයන අංශය |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | භෞතික විද්‍යා අධ්‍යයන අංශය<br>පරිගණක විද්‍යා අධ්‍යයන අංශය |

06-647

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A-G-000084- 650 (2001/06)